
# යෞවනයන් සමග විද්‍යා සන්නිවේදනය උදෙසා
# අන්තර්ජාලය සහ ජංගම දුරකථන භාවිතය

තුසිත මලලසේකර



සංවර්ධනය පිණිස වන විද්‍යාත්මක තොරතුරු සමීප කරවීම සඳහා යෞවනයන් සමග සන්නිවේදනය කිරීම ඉතාමත් වැදගත්ය. අදහස් හුවමාරු කරගැනීමට, නව අදහස් සහ ව්‍යවහාරයන් සමග යාවත්කාලීන වීම සඳහා උගැන්වීමට, අප ඔවුන් සමග සාර්ථක ලෙස සන්නිවේදනය කළ යුතු වේ. විශාල ග්‍රාහක පිරිසක් සමග සන්නිවේදනය උදෙසා ඇති මෙවලම ''මාධ්‍යය'' වෙයි. වර්තමානයේ සාම්ප්‍රදායික ''මාධ්‍ය'' තුළට ඇතුළත් වනුයේ පුවත්පත්, සඟරා, ගුවන් විදුලිය හා රූපවාහිනිය පමණක් නොවේ. අන්තර් ජාලය සහ ජංගම දුරකථනද එයට අන්තර්ගතය.




මේ දිනවල ලෝකය පුරා වැඩසටහන් ගණනාවක්ම තරුණ අය සමග සන්නිවේදනය උදෙසා අන්තර්ජාලය සහ ජංගම දුරකථන වෙතට නැඹුරුවෙමින් පවතියි. මෙහිදී ඇතුළත් වන විෂය අතර විද්‍යාව, සෞඛ්‍යය සහ කෘෂිකර්මයද වෙයි.

මෑත කාලයේදී මෙම තාක්ෂණ ලද හැකි බව සහ ජනප්‍රියත්වය හිමි කර ගෙන ඇත්තේ මහත් පිබිදීමකින් යුතුවය. තරුණ අය අතර විශේෂයෙන්ම එය ඉහළ මට්ටමකට ළඟා වනු ඇත. එමගින් තොරතුරු ව්‍යාප්තියට නව හා නැවුම් අවස්ථා උදාකර ඇත. එසේ වුවද මෙම තාක්ෂණ සමහර අවස්ථාවලදී වැදගත් සහ වලංගු ප්‍රශ්නද මතුකරයි. එවැනි ප්‍රශ්න අතර,

- විද්‍යාත්මක දැනුම නංවාලීමට හෝ සෞඛ්‍යමය ප්‍රස්තුතයන්ට මැදිහත්වීම හෝ ඉහළ නැංවීමට අන්තර්ජාලය සහ ජංගම දුරකථන සාර්ථකව භාවිත කළ හැක්කේ කෙසේද?
- මෙම තාක්ෂණ භාවිතයේ පවත්නා වාසි සහ අභියෝග කවරේද?
- අන්තර්ජාලය සහ ජංගම දුරකථන භාවිතය මගින් සිදු කෙරෙන මැදිහත්වීම් සාර්ථක වන බව සනාථ කරන සාක්ෂි හා සාධක තිබේද?

මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමේදී පැහැදිලි පිළිතුරු මෙතෙක් ලද නොහැකි වී ඇත. අන්තර්ජාලය හා ජංගම දුරකථන තරුණ ජනතාව වෙත සමීප වීමේ සන්නිවේදන මෙවලමක් ලෙස මහත් බලාපොරොත්තු පිහිටුවා ඇති අතර මෙතෙක් කර ඇති ඇගයීම් මගින් හෙළි කර ඇති ප්‍රතිඵල නිශ්චිත නිගමන ලබා නොදෙන අතර සමහර අවස්ථාවලදී මිශ්‍ර ප්‍රතිඵල ලබා දී තිබීම ද සැලකිල්ලට ගත යුතුය.

## අන්තර්ජාලය

1980 අග භාගයේදී විශ්ව විසිරි වියමන (වර්ල්ඩ් වයිඩ් වෙබ්) නම් සංසිද්ධිය ලෝකය පුරා පැතිර ගියේ මහත් කුණාටුවක් විලසිනි. නමුත් තවමත් සංවර්ධනය වන රටවල අන්තර්ජාලයට සමීප වීමේ හැකියාව සාධක ගණනාවක් මත රැඳී පවතියි. එම සාධක අතර, තාක්ෂණයට භෞතික ලෙස සමීප වීමට පවත්නා හැකියා, මූල්‍ය ස්ථාවරත්වය, ආදායම ඇතුළු සමාජ ආර්ථික සාධක මෙන්ම භාෂා ප්‍රවීනත්වය ඇතුළු අධ්‍යාපනය, වයස, පුම්තිරි බව, භූ ගෝලීයව පදිංචි ස්ථානය සහ සංස්කෘතිය ඇතුළු ප්‍රජා විද්‍යාත්මක සාධක පවතියි.

ශ්‍රී ලංකාව තුළ අන්තර්ජාල ප්‍රවේශ පහසුකම් ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතියි. වර්තමාන පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් මෙන්ම පාසල් හැර ගිය දරු දැරියන් හා තරුණ තරුණියන් අන්තර්ජාලය භාවිතය කෙරෙහි මහත් උනන්දුවක් දක්වනු පෙනේ. එහෙත් ඒ අධ්‍යාපන කටයුතු හා සම්බන්ධව පමණක් නොවන බවද කිව යුතුය.

වෙබ් පාදිත මූලාරම්භ තරුණ අය හට අධ්‍යාපනය ලබා

දීමේ අතිරේක මාර්ග විවෘත කර ඇත. උදාහරණයක් ලෙස සෞරග්‍රහ මණ්ඩලය සහ අභ්‍යවකාශ ගවේෂණ කටයුතු පිළිබඳ තොරතුරු සපයන හෝ සෞඛ්‍ය ප්‍රස්තුත හා සම්බන්ධ කළ යුතු නොයුතු දේ දක්වෙන හෝ වෙබ් පිටු ඇත්නම් තරුණ අය හට ස්වයං මාර්ගෝපදේශිතව අධ්‍යාපනය ලැබීමට අවස්ථාව උදා වෙයි.

වෙබ් අඩවි, විද්‍යාව හා සම්බන්ධ සේවා සැපයීමට සහ ප්‍රවර්ධනය කිරීමටද භාවිත කළ හැකිය. උදාහරණයක් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන නවතම සේවා පිළිබඳ තොරතුරු තරුණ ගොවීන් හට ලබා දීමට එමගින් පුළුවන. එසේම මාර්ග ගත සිතියම් සලකුණු වැඩසටහන් ඔස්සේ කෘෂිකර්ම සේවා මධ්‍යස්ථාන හෝ අදාළ මිල ගණන් සමග නිෂ්පාදන මිලදී ගන්නා මධ්‍යස්ථාන හෝ දක්වීමටද වෙබ් අඩවි යොදා ගත හැකිය.

වෙබ් පාදිත මූලාරම්භයන් වෙත සමීප වීම සීමා කරවන බාධක කිහිපයක් ද පවතියි. ඒ සඳහා ප්‍රමාණවත් තාක්ෂණ සහාය මෙන්ම ප්‍රබල පරිගණක ජාල පැවතීමද අවශ්‍යය. ශ්‍රී ලංකාවේ ජනගහනය තුළ තමන්ගේම පෞද්ගලික පරිගණක සතු වූ අය සිටිනුයේ ඉතා සුළු සංඛ්‍යාවකි. එහෙයින් ''ප්‍රජා පරිගණක මධ්‍යස්ථාන'' පහසුකම් ඇති කිරීමේ සංකල්පය ප්‍රමාණවත් ලෙස වර්ධනය කළ යුතුය.

## ජංගම දුරකථන



පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවෙහි ජංගම දුරකථන භාවිතය නොසිතූ විරූ ලෙස ඉහළ ගොස් ඇත. මෙම දුරකථන යොදා ගනු ලබන්නේ ඇමතුම් දීමට හා ගැනීමට පමණක් නොවේ. ඒවා බහුලව භාවිත වන තවත් ක්ෂේත්‍රයක් වනුයේ ''එස්. එම්. එස්'' ලෙස ජනප්‍රියව ඇති කෙටි පණිවිඩ ලබා දීමේ හා ලබා ගැනීමේ සේවය (ෂෝර්ට් මෙසේජ් සර්විස්) ය. මෙම පණිවිඩ යැවීම ඉතා ලාබදායී මෙන්ම විශ්වාසදායී ද වෙයි. එසේම මෙරට තරුණ පිරිස ජංගම දුරකථන භාවිතය කෙරෙහි පමණක් නොව කෙටි පණිවිඩ සේවා යොදා ගැනීම කෙරෙහිද මහත් උනන්දුවක් සහ සාර්ථක අනුගතවීමක් දක්වති.

ජංගම දුරකථන භාවිතය මගින් විද්‍යාව, සෞඛ්‍යය සහ කෘෂිකර්මය ආදී විෂයන්ටද අදාළ ප්‍රස්තුත සඳහා වන සන්නිවේදන මැදිහත්වීම්හි නිරත වීම ලෝකය පුරා බොහෝ රටවල දැන් ඉහළ යමින් පවතියි. උදාහරණයක් ලෙස උගන්ඩාවෙහි රාජ්‍ය නොවන සංවිධානයක්, එරට විදුලි සංදේශ සමාගමක් සමග එක්ව තරුණ අය අතර එච්. අයි. වී. ඒඩ්ස් පිළිබඳව පවත්නා දැනුවත්භාවය නංවාලීමේ පණිවිඩ ව්‍යාප්ත කිරීමේ ව්‍යායාමයක සාර්ථක ලෙස නිරත වීම දක්විය හැකිය. ඉන්දියාවේ ''ඒඩ්ස් වීරයෝ'' (හීරෝ ඒඩ්ස්) ව්‍යාපෘතිය මගින් හඳුනාගත් ජංගම දුරකථන විභවමය හැකියාව වූයේ, වෙනස්කම් කිරීම්වලට ලක්වේය යන බිය හේතු කොට, තහංචි සහිත තේමා පිළිබඳ ප්‍රශ්න නොවිමසන අය වෙත සමීප වීමේ අවස්ථාව කෙටි පණිවිඩ හරහා ලබා ගත හැකි බවය.

සමහර වැඩසටහන් දැනටමත් ක්‍රියාත්මක ව්‍යාපෘති පරිපූරණය සඳහා ජංගම දුරකථන යොදා ගැනින. ''ජීවත්වීම පිළිබඳ ඉගෙනීම'' ලෙස හැඳින්වෙන නයිජීරියාවෙහි ක්‍රියාත්මක ව්‍යාපෘතියෙහි එහි ප්‍රතිලාභීන්හට තමන් මුහුණ දෙන ගැටළු පිළිබඳව සිය පුහුණුකරුවන් සහ අදාළ වෙනත් වෘත්තීය සම්පත් දායකයන්ගෙන් කෙටි පණිවිඩ ඔස්සේ විසඳුම් ලබා ගැනීමට අවස්ථාව ලබා දී ඇත.

**ජංගම දුරකථන භාවිතය මගින් විද්‍යාව, සෞඛ්‍යය සහ කෘෂිකර්මය ආදී විෂයන්ටද අදාළ ප්‍රස්තුත සඳහා වන සන්නිවේදන මැදිහත්වීම්හි නිරත වීම ලෝකය පුරා බොහෝ රටවල දැන් ඉහළ යමින් පවතියි. උදාහරණයක් ලෙස උගන්ඩාවෙහි රාජ්‍ය නොවන සංවිධානයක්, එරට විදුලි සංදේශ සමාගමක් සමග එක්ව තරුණ අය අතර එච්. අයි. වී. ඒඩ්ස් පිළිබඳව පවත්නා දැනුවත්භාවය නංවාලීමේ පණිවිඩ ව්‍යාප්ත කිරීමේ ව්‍යායාමයක සාර්ථක ලෙස නිරත වීම දැක්විය හැකිය.**

සමාජ අලෙවිකරණ ප්‍රවේශයක් සහිත වැඩසටහන්වල දී ''පණිවිඩය අලෙවි කිරීම'' සඳහා සහ සේවා ලබා දීම සඳහා ද ජංගම දුරකථන භාවිත කෙරේ. එහිදී ද ප්‍රමාණවත් සාර්ථකත්වයක් හිමි කර ගැනීමට සමත්ව ඇත. එහෙයින් ශ්‍රී ලංකාවේද විද්‍යාතා මධ්‍යස්ථාන, සෞඛ්‍ය ආයතන සහ කෘෂි සේවා ව්‍යාප්ති මධ්‍යස්ථාන යනාදියට සිය අදාළ පාරිභෝගිකයන් අතරට තම සේවා ගෙනයාමට ජංගම දුරකථන කෙටි පණිවිඩ සේවාව භාවිත කළ හැකිය.

විද්‍යාත්මක දැනුම ව්‍යාප්තියේදී අන්තර්ජාලය සහ ජංගම දුරකථන භාවිතයේ ඇති ප්‍රයෝජනවත් බව පිළිබඳව නිගමනයකට එළඹීමට තරම් තවමත් කාලය පැමිණ නැත. එසේ වුවද දැනට දක්නට ලැබෙන සියළු ලක්ෂණ සහ ප්‍රවනතා පෙන්වා දෙනුයේ මාධ්‍ය ක්ෂේත්‍රයට ''අලුතෙන්'' එක්වූ මෙම තාක්ෂණ සංවර්ධන සන්නිවේදනයේ නව මං මාවතක් හෙළි පෙහෙළි කිරීමට, නව යුගයක් උදා කිරීමට, සැදී පැහැදී සිටින බව යැයි හැඟේ.

**තුසිත මලලසේකර**